# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2047/44 - 2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* KDS/MDB/4/2/1/64/15.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* L/03/J95/FR/191.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*(නකල්ස් රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීම)*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩසියපත්තුව දකුණ කෝරළේ සුළු කොට්ඨාසයේ මාංගොඩ (806) ග්‍රාම නිලධාරි වසමේ මාංගොඩ ගමේ පිහිටි, මහනුවර ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ මූලික පිඹුරු අංක මහ 6719 හා 2017.09.29 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1621 ක් වූ අගුරුපොල වත්ත *හෙවත්* අගුරුකොළ වත්ත නැමති ඉඩම:

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: අගුරුපොල වත්ත *හෙවත්* අගුරුකොළ වත්ත; ඉඩමේ විස්තර: ලඳු කැලය; හිමිකම් කියන අය : මාංගොඩ, මැදමහනුවර පදිංචි මියගිය ඩබ්. ආර්. එම්. උක්කුබණ්ඩා; ප්‍රමාණය: 0.1621 හෙක්ටයාර්.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 පෙබරවාරි මස 21 වැනි දින ප. ව. 2.00 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 පෙබරවාරි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඒ. එම්. වික්‍රමාරච්චි,
ප්‍රාදේශීය ලේකම් ,
මැදදුම්බර.

2017 නොවැම්බර් මස 24 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-510

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය*:* KDS/MDB/4/2/1/64/11.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: L/03/J95/FR/185.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම්

1A - G 26719 - 32 - (2017/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*(නකල්ස් රක්ෂිතය සඳහා ඉඩම් අත්කර ගැනීම)*

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩසියපත්තුව සුළු කොට්ඨාසයේ මාංගොඩ (806) ග්‍රාම නිලධාරි වසමේ මාංගොඩ ගමේ පිහිටි, මහනුවර ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ මූලික පිඹුරු අංක මහ 6681 හා 2017.07.20 දිනැති පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 7.1858 ක් වූ දෙමෝදර කැළේ නැමති ඉඩම:

**01. කැබලි අංක 01**

ඉඩමේ නම: දෙමෝදර කැළේ; ඉඩමේ විස්තර: ලඳු කැලය; හිමිකම් කියන අය : මාංගොඩ, මැදමහනුවර පදිංචි ඩී. ආර්. එම්. පී. බී. රත්නායක, ආර්. එම්. එස්. බී. රත්නායක; ප්‍රමාණය: 7.1858 හෙක්ටයාර්.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2018 පෙබරවාරි මස 28 වැනි දින පෙ. ව. 10.00 ට මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 පෙබරවාරි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඒ. එම්. වික්‍රමාරච්චි,
ප්‍රාදේශීය ලේකම් ,
මැදදුම්බර.

2017 නොවැම්බර් මස 24 වැනි දින,
මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.